# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2378/41 – 2024 අප්‍රේල් මස 05 වැනි සිකුරාදා – 2024.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 31ආ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද කොග්ගල කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම.

ඩග්ලස් දේවානන්දා,
ධීවර අමාත්‍ය.

2024 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දීය.

කොග්ගල කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම

ශ්‍රී ලංකාවේ පිහිටි කලපු 116ක් අතරින්, ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි කොග්ගල කලපුවේ, පාරිසරික තත්වයන් තිරසාරව පවත්වා ගැනීමටත් එතුළින් කලපුව හා ඒ ආශ්‍රිතව සිදුකරන්නා වූ ජීවනෝපායන් සුරක්ෂිත කිරීම හා වැඩි දියුණු කිරීම අරමුණ ඇතිව මෙම නීති රීති හා රෙගුලාසි, මූලධර්ම හා ක්‍රියාත්මක ක්‍රමවේදය ඇතුළත් ලියවිල්ල සම්පාදනය කොට ඇත.

මෙම සැලැස්ම කොග්ගල කලපු සහ-සහභාගීත්ව කමිටුව විසින් අනුමත කොට ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ පසු මෙම සැලැස්ම පනතේ සඳහන් කාරණා හා ඇති අනුකූලතාව විමසා බලා ධීවර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කරනු ලැබේ.(31ආ වගන්තිය)

අමාත්‍යවරයා මගින් මෙම සැලැස්ම අනුමත කොට *ගැසට් පත්‍රයේ* පළකල පසු මෙහි සඳහන් කාරණා ක්‍රියාත්මක තත්වයට පත්වේ. (31 ආ. 4 වන උපවගන්තිය)


1A – PG 6688 – 604 (2024/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

61 වන වගන්තිය යටතේ සුදුසු නියෝග සෑදීමෙන් සහ 34 වන වගන්තිය යටතේ සුදුසු නිවේදන පළකිරීම මගින් සැලසුමේ විධිවිධානවලට අමාත්‍යවරයා විසින් බලාත්මකභාවයක් ලබාදිය යුතුය. (31 ආ. 5 වන උපවගන්තිය)

**01. කොග්ගල කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගීත්ව කමිටුව**

2013 අංක 35 දරන පනත මගින් සංශෝධිත 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 31අ වගන්තියට අනුව, ධීවර අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන කමිටුව මින්මතු කොග්ගල කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගීත්ව කමිටුව යනුවෙන් නම් කරනු ලැබේ. එහි සංයුතිය ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත.

**02. කොග්ගල කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගීත්ව සැලැස්ම ක්‍රියාත්මක වන බල ප්‍රදේශය**

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදූව හා ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් කොග්ගල කලපු ජල තීරය හා ඊට යාබද හඳුනාගන්නා ලද ග්‍රාම නිලධාරී වසම් 14 කට අයත් වන්නා වූ ගොඩබිම් තීරය (2013 අංක 35 දරන ධීවර ජලජ සම්පත් සංශෝධන පනතේ ධීවර කළමනාකරණ ප්‍රදේශ 31(1) වගන්තිය යටතේ අංක 1997/18 සහ 2016.12.15 වන දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කොග්ගල කලපු ධීවර කළමනාකරණ බල ප්‍රදේශය ලෙස හැඳින්වේ.)

- භූගෝලීය වපසරිය : GPS දත්ත ඇතුළත් සිතියම මඟින් කොග්ගල කලපුව තුළ හඳුනාගන්නා ලද, කලපු බල ප්‍රදේශය පැහැදිලි කෙරෙනු ඇත. (ඇමුණුම් අංක 2)
- කොග්ගල කලපුවේ හඳුනා ගන්නා ලද ගොඩබිම් තීරයට මායිම් වන හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම්:

  1. ගොඩවත්ත - 149C
  2. හරුමල්ගොඩ නැගෙනහිර - 149A
  3. කටුකුරුන්ද - 144C
  4. කොග්ගල අතිරේක 2 - 144E
  5. කොග්ගල අතිරේක 1-144D
  6. කොග්ගල - 144A
  7. අටදාහේවතුගොඩ -162A
  8. කතළුව බටහිර - 162
  9. අලවතුකිස්ගොඩ - 164G
  10. පැලැස්ස - 166C

- කොග්ගල කලපුවේ හඳුනාගන්නා ලද ගොඩබිම් තීරයට මායිම් වන ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම්:

  1. තිත්තගල්ල - 166A
  2. කහඳ - 167
  3. කහඳ අතිරේක - 167A
  4. පොල්හේන 154B

**03. කොග්ගල කලපුවේ ධීවර කළමනාකරණ සහ-සහභාගීත්ව කමිටුව මැදිහත්ව ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම්**

- කොග්ගල කලපුව තුළ හා ඒ ආශ්‍රිත ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ හැකි හෝ කළ යුතු ක්‍රියාකාරකම්/ සංවර්ධන යෝජනා ඇතුළත් සැලැස්ම වාර්ෂිකව සම්පාදනය කොට සැලැස්මේ පෙන්වා දී ඇති මූලධර්ම මත පිහිටා ක්‍රියාත්මක කිරීම.

- කොග්ගල සහ-සහභාගිත්ව කමිටුවේ සියළු සාමාජිකයින් හා පාර්ශව ආයතන, මෙම සැලැස්ම මත පිහිටා තම සේවාවන් ක්‍රියාත්මක කිරීම හා අදාළ අවසරයන් ලබාදීම සිදුකළ යුතු ය.

**04. මූලධර්ම**

කලපු පරිසර පද්ධතියේ සම්පත්, කලපු පරිසර පද්ධතියේ ජෛව විවිධත්වය සංරක්ෂණය, වනජීවී සහ පරම්පරා අතර සාධාරණත්වය ඉටුවන පරිදි නෙළා ගැනීම, භාවිතය හා පරිභෝජනය සම්බන්ධ තීරණ ගැනීමේ දී සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව මඟින් පහත දක්වා ඇති මූලධර්ම, හර පද්ධතීන්ට අනුගතව කටයුතු කළ යුතු ය.

- සම්පත් සමානව බෙදීයාම
- නීතිගරුක බව
- සහ-සහභාගීත්වය/ නියෝජනය
- විනිවිදභාවය
- පරිසර හිතකාමී බව
- කාර්යක්ෂමභාවය හා සඵලදායිත්වය
- වගවීම
- පොදු එකඟතාවය (ජාති/ ආගම්/ කුල/ දේශපාලනික/ වෘත්තිය බලය නොසලකා)
- ඵලදායී ප්‍රතිචාරය
- සාමූහිකත්වය

**05. ආයතනික ව්‍යුහය**

***05.01. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය***

1. කොග්ගල කලපුව තුළ ධීවර කර්මාන්තයේ නියුතු කලපු ධීවරයින් ඇතුළත් කලපු කළමනාකරණ කමිටු 04 කි. ( 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 32 වගන්තියේ 3 වන උපවගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර කමිටු ප්‍රකාශයට පත්කිරීමේ අංක 2027/33 සහ 2017.07.13 වන දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* ඇමුණුම 03 යටතේ දක්වා ඇත.)

| *ධීවර කමිටුවේ නම* | *ලියාපදිංචි අංකය* |
|---|---|
| 1.1 කොග්ගල - ගුරුකන්ද කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ ධී. කමිටු/ කො.ක./ 01 |
| 1.2 කොග්ගල - දූව මලලගම කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ ධී. කමිටු/ කො.ක./ 02 |
| 1.3 කොග්ගල - 144 ඒ මෝදරගොඩ (සිංහධීවරගම) කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ ධී. කමිටු/ කො.ක./ 03 |
| 1.4කොග්ගල - පැලැස්ස කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ ධී. කමිටු/ කො.ක./ 04 |

- ගුරුකන්ද කලපුව තුළ ධීවර කර්මාන්තයේ නියුතු - සාමාජිකයින් 52 කි.
- දූවමලලගම කලපු ධීවර කළමනාකරණ කමිටුව (මාගල්තොට/ දූවමලලගම/ හරුමල්ගොඩ) - සාමාජිකයින් 110කි
- පැලැස්ස ධීවර සංවිධානය හෙවත් පැලැස්ස කලපු ධීවර කළමනාකරණ කමිටුව (බොරළුකැටිය/ පැලැස්ස/ තිත්තගල්ල) - සාමාජිකයින් 52 කි.
- සිංහධීවරගම කලපු ධීවර කළමනාකරණ කමිටුව(කොග්ගල) - සමාජිකයින් 38 කි

2. කලපු ධීවර කළමනාකරණ කමිටු 04 වෙන වෙනම සෑම මසකට වරක් එකඟව ඇති දිනයන්හි දී රැස්වනු ලැබේ.

3. කලපු කළමනාකරණ කමිටු 04 තුළදී නාම යෝජනා සම්මතයෙන් එක් කමිටුවක සාමාජිකයින් 03 බැගින් සමාජිකයින් 12ක් කොග්ගල කලපු සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව නියෝජනය කරනු ලැබේ.

4. කලපු ධීවර කළමනාකරණ කමිටු 04 හි වාර්ෂික මහ සභාව සෑම වසරකම දෙසැම්බර් මාසයේ දී පවත්වනු ලබයි.

5. කොග්ගල කලපු ධීවර කළමනාකරණ කමිටු 04 හි නියෝජනය සහිතව, 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතට අනුකූලව

2013 අංක 35 දරන ධීවර හා ජලජ සම්පත් සංශෝධන පනතේ ප්‍රතිපාදනයන්ට අනුව කොග්ගල කලපුව සඳහා සහ- සහභාගීත්ව කමිටුව පිහිටුවනු ලැබේ. එහි සංයුතිය ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත. (මෙම කමිටුව සඳහා කලපුව වටා ඇති ගොවි සංවිධාන නියෝජිතයින් ඇතුළත් කොට ඇත.)

6. කොග්ගල කලපු සහ-සහභාගීත්ව කමිටුව සෑම මාස 03 කට වරක් පැවැත්වෙන අතර දිස්ත්‍රික්කයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයා එහි කැඳවුම්කරු ලෙස ක්‍රියා කරන අතර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් එය පැවැත්වේ.

7. අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයක දී එම කමිටුව නියමිත කාලයට පෙර වුවද රැස්විය හැකි වන්නේය.

**05.02 ආයතනික ව්‍යුහය තුළ තීරණ ගැනීමේ ක්‍රමවේදය**

1. කලපුවේ ජලජීවී සම්පත් නෙළා ගැනීම, භාවිතය හා පරිභෝජනය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය කලපු ධීවර කළමනාකරණ කමිටු හා කොග්ගල සහ-සහභාගීත්ව කමිටුව විසින් මෙම සැලැස්ම තුළ හඳුනාගෙන ඇති මූලධර්ම හා එකඟතාවයන්ට යටත්ව සිදුකළ යුතුය.

2. කොග්ගල කලපු සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටු සභාපති ලෙස ගාල්ල දිස්ත්‍රික් ලේකම් කටයුතු කරනු ලැබේ.

3. කලපුව තුළ ධීවර මෙහෙයුම් කිරීම පිළිබඳ, කලපු ධීවර කළමනාකරණ කමිටුව හෝ එසේත් නැතිනම් ධීවර නිලධාරීන් අධීක්ෂණ කටයුතු සිදුකළ යුතුය. එහිදී යම් විසඳාගත නොහැකි කරුණු මතු වුවහොත් එය කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටු වෙත යොමු කළ යුතුය.

4. කොග්ගල කලපු සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව සඳහා කලපු ධීවර කළමනාකරණ කමිටුවල යෝජනා ඉදිරිපත් කිරීමේ දී ඉදිරිපත් කළ යුතු යෝජනා සම්බන්ධව එක් එක් කලපු ධීවර කළමනාකරණ කමිටු විසින් බහුතර අනුමැතියෙන් යෝජනා ස්ථිර කොට කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුවේ දී සංවාදයට හා තීරණ ගැනීමට ලක්කළ යුතු ය.

5. කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුවේ තීරණය සඳහා, කොග්ගල කලපු ධීවර කළමනාකරණ කමිටුව විසින් ඉදිරිපත් කරන යෝජනා හා අනිකුත් පාර්ශවකරුවන්ගේ ඉදිරිපත්වන යෝජනා කොග්ගල සහ - සහභාගීත්ව කමිටුව තුළ (අංක 05.02.1) ට යටත්ව සාකච්ඡාවට ගතයුතුය.

6. කලපු පරිසර පද්ධතියට බලපෑම්වන්නේ යැයි හැඟෙන ආකාරයේ සංවර්ධන යෝජනාවක්, කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව සාමාජික ආයතන හෝ පාර්ශවකරුවන් වෙත අවශ්‍ය අවසරයන් හා සංවාදයන් සඳහා ඉදිරිපත්වීමේ දී හෝ එවන් සංවර්ධන යෝජනාවක් ක්‍රියාත්මක කිරීමේ දී, කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටු වෙතින් අවශ්‍යය අනුමැතිය පළමුව ලබා ගත යුතු වන්නේය.

6.1. එම අනුමැතිය ලබා දීමේ දී එම ව්‍යාපෘතියට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ද කලපුවේ අනෙකුත් සීමාවන්හි දී මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ලබාගන්නා ලෙසත් ඉන් පසු අදාල වාර්තාවේ නිර්දේශ කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුවේ තාක්ෂණ කමිටුවේ නිර්දේශයට ඉදිරිපත් කළ යුතුය.

6.2. කොග්ගල කලපු සහ-සහභාගීත්ව කමිටුව හා තාක්ෂණ කමිටුව ඉදිරිපත්වන යෝජනා පිළිබඳ තීරණ ගැනීමට නොහැකි අවස්ථාවක් උදාවුවහොත් ඒ පිළිබඳ තීරණ ගැනීමට පහසු කරවීම සඳහා සහ-සහභාගීත්ව කමිටුව විසින් ජාතික මට්ටමේ අදාළ විෂය සම්බන්ධව කටයුතු කරන ආයතන වල මතය විමසා අවශ්‍යය තීරණ ගත හැකි වන්නේය.

7. කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව විසින් කලපුවට අදාළව ප්‍රධාන අංක 05 යටතේ දක්වා ඇති පරිදි සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නංවමින්, අධීක්ෂණය, නියාමනය හා පසුවිපරම් කිරීම සඳහා කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව කටයුතු කළ යුතුය.

**05.03. කොග්ගල කලපු මෝය විවෘත කරන ක්‍රමවේදය**

1. කොග්ගල කලපු සහ - සහභාගීත්ව කළමනාකරණ කමිටුව හෝ ඒ යටතේ පිහිටුවා ඇති තාක්ෂණ කමිටුව විසින් කොග්ගල මෝය විවෘත කිරීමේ ක්‍රමවේදය සඳහා අවශ්‍යය සම්බන්ධීකරණයන් සිදු කළ යුතුය. ඒ අනුව, කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටු සාමාජිකයකු වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව පහත ආයතන හා එක්ව අදාළ කාර්යයන් ක්‍රියාවට නැංවිය යුතු ය.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කලපුවේ ගංවතුර සීමාව (අඩි 1 යි අඟල් 9) හඳුනාගෙන තිබිය යුතුය. එම සීමාව ඉක්මවූ විට ගංවතුර ආපදාව යන කාරණය මත කලපු මෝය විවෘත කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව පහත පරිදි කටයුතු කළ යුතු ය.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කලපු මෝය ආසන්නයේ කලපු ජල මට්ටම හා ගං වතුර මට්ටම සඳහන් වන මිණුම් උපකරණයක් සවිකළ යුතුය. නැතහොත් කතළුව පාලමේ හෝ එය සඳහන් කළ යුතුය.

4. ගංවතුර අවස්ථාවක දී කලපු මෝය ආශ්‍රිත වැලිවැටිය ඉවත් කිරීම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය තිබිය යුතු අතර මෙයට පෙර අවස්ථා කිහිපයක දී වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කලපු මෝය විවෘත කල අයුරින් කලපු මෝය විවෘත කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හැකියාව ඇත. නමුත්, ඒ සෑම අවස්ථාවක් සඳහාම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අධීක්ෂණය සඳහා මැදිහත්වීම අනිවාර්ය වේ.

5. ගංවතුර අවස්ථාවක් මතු වූ විට මෝය තුළ ඇති වැලිවැටිය කපා කලපු ජලය මුහුදට යැවීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඉටු කළ යුතුය.

6. කලපු වැලි වැටිය ඉවත් කිරීමේ දී වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත්කොට එම ආයතනයේ නිලධාරියකු අධීක්ෂණය හෝ අනුදැනුම මත වැලි වැටියේ අවශ්‍යය ප්‍රමාණය ඉවත් කර ගංවතුර අවධානම පාලනය කර ගත යුතුය.

7. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හඳුනාගෙන ඇති අඩි 1.9 ගංවතුර සීමාවට අමතරව කලපුව ආසන්නයේ කුඹුරු ඉඩම් වලට වැසි ජලයෙන් යටවීමේ හානිකර තත්වයක් මතු වූ විට තිත්තගල්ල නැගෙනහිර හෝ බටහිර ගොවි සංවිධාන මඟින් ක්ෂෙත්‍ර මට්ටමේ කෘෂිකර්ම නිලධාරීන් හරහා තාක්ෂණ කමිටුවේ හඳුනාගෙන ඇති ආයතන හරහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කලපු මෝය කපා ජලයෙන් යටවන කුඹුරු ඉඩම් සඳහා ඇතිවන හානිය අවම කිරීමට උත්සහ ගතයුතුය. මෙම අවස්ථාවේ දී ද වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය ලබා ගත යුතු ය.

8. ඉහත දක්වා ඇති කාරණාවන්ට බාහිරව කිසිඳු පාර්ශවයක් මෝය ආශ්‍රිත වැලි වැටිය ඉවත් නොකළ යුතුය.

**06. කලපුවේ ආරක්ෂිත ස්වාභාවික සම්පත්**

- කලපු කළමනාකරණ බල ප්‍රදේශය තුළ ඇති ගොඩබිම් තීරය/ කලපු ජලය/ මත්ස්‍යයින්, පක්ෂීන් එහි ඇති ජලජ සම්පත් සහ අනෙකුත් ජලජ ජීවීන් සහ හඳුනාගන්නා ලද දූපත් ද ඇතුළුව කඩොලාන පරිසර පද්ධතියේ ඇති සියළුම ශාක ප්‍රජාවන් කොග්ගල කලපුවට අයත් ස්වාභාවික සම්පත් ලෙස නම් කෙරෙනු ඇත.

- කඩොලාන ආශ්‍රිත ප්‍රදේශය, කලපු බල ප්‍රදේශය GPS ඛණ්ඩාංක සලකුණු කිරීමේ දී හඳුනාගෙන ඇති අතර එම ප්‍රදේශය, පාරිසරික සංවේදී ප්‍රදේශයක් ලෙස නම් කරනු ඇත.

- ජලජ ජීවීන් අභිජනනය වන විශේෂිත ස්ථාන හඳුනාගෙන එම ස්ථාන හා සීමාවන් මත්ස්‍යය අස්වනු නෙලීමට තහනම් කලාප ලෙස නම් කරනු ඇත. (කොග්ගල ගුවන් හමුදා කඳවුර විසින් බෝයාවන් යොදා වෙන්කොට ඇති සීමාව)

- ආහාරයට ගන්නා මසුන් හැර අනෙකුත් සියළුම ජීවී හෝ අජීවී සම්පත් කොග්ගල සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුවේ අවසරයකින් හෝ අනුමැතියකින් තොරව පර්යේෂණ කිරීම/ අත්පත් කර ගැනීම/ විනාශ කර ගැනීම/ ගොඩ කිරීම යන කාරණා කොග්ගල කලපු ධීවර කළමනාකරණ සැලැස්ම උල්ලංඝනය කරන කාරණා ලෙස සැලකෙන අතර එවන් කිසිඳු ක්‍රියාවක් කලපු සීමාව තුළ හා රක්ෂිත ප්‍රදේශ තුළ සිදු නොකළ යුතු ය.

- කලපුවට ජලය පැමිණෙන ඇල මාර්ග රක්ෂිතය, ඇල ඉවුරේ සිට එක් පසකට අවම මීටර් 1.5 ක් බැගින් විය යුතු ය.

- පුවක්ගහකිස්ස ඇල
- කහඳ ඇල
- පම්බානම් ඇල
- මත්තේගොඩ ඇල
- අටානාකිත ඇල
- කීනත් ඇල
- වැලි තුඩුව ඇල
- පැලැස්ස මහ ඇල
- පැලැස්ස පොඩි ඇල
- හොරකන්දෙනිය ඇල
- ඉදන්කිස්ස ඇල
- වැලමඩ/ පොල්හේන ඇල

**07. කොග්ගල කලපුව තුළ කළ හැකි හා කළ නොහැකි ක්‍රියාකාරකම් හා සීමාවන්**

*07.01 කොග්ගල කලපු ධීවරයින් සඳහා,*

1. කොග්ගල කලපු ධීවරයින්ගේ සමාජිකත්වයෙන් පිහිටුවා ඇති කලපු ධීවර කළමනාකරණ කමිටු 04 තුළ උපරිම ලියාපදිංචි ධීවරයින් 700කට පමණක් කලපුව තුළ ධීවර කර්මාන්තයේ නියැලීමට අවසර ලැබේ.

2. කොග්ගල කලපුව ධීවර කර්මාන්තයේ නියුතු සෑම ධීවරයකුම තමන්ට ඔරුවක් අයත් නම්, එම ඔරුව ධීවර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරවා ගත යුතු අතර අදාළ ලියාපදිංචි අංකය පැහැදිලිව පෙනෙනසේ ඔරුවේ සටහන් කර තිබිය යුතුය.

3. කොග්ගල කලපුව තුළ ධීවර කර්මාන්තයේ නියුතු සෑම ධීවරයකුම තමන් සිදුකරන පන්න ක්‍රමය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයුම් බලපත්‍රයක් ලබා ගත යුතුය.

4. ධීවර මෙහෙයුම්, දිනකට එක්වරක් පමණක් සිදුකළ යුතුය. අවශ්‍යය අවස්ථාවන්හි දී ඒ සඳහා සීමා පැනවීමට බලය ඇත.

5. කලපුව තුළ සිදු කළ හැකි පන්න ක්‍රමය වනුයේ,

- දැල් එලීම
- විසිදැල් ගැසීම
- බිලී පිති භාවිතයෙන් මාළු බෑම පමණි.

6. කලපුව තුළ එළන දැල් භාවිතා කිරීමේ දී එම දැල් සඳහා නිසි බෝයාවන් සවිකර තිබිය යුතුය/ හඳුනාගැනීමේ ලකුණු යෙදිය යුතුය.

7. ලියාපදිංචි ධීවරයෙකුට කලපුව තුළ භාවිතා කළ හැකි උපරිම එළන දැල් ප්‍රමාණය වනුයේ දිග බඹ 28 (මීටර් 56) බැගින් වූ පීස් 06 ක් පමණි (කලපුවේ මත්ස්‍යය අස්වැන්න අඩු වූ විට මෙම දැල් පීස් ප්‍රමාණය කලපු ධීවර කළමනාකරණ කමිටු තීරණය මත අඩු කළ හැක.)

8. කකුළුවන් සඳහා එළන දැල් අතංගු භාවිතා කළ හැකි අතර එහි ඇස් ප්‍රමාණය අවම අඟල් 4 වේ. එය භාවිතා කළ හැකි කාලය වනුයේ දවසේ පෙරවරු 8.00ත් පස්වරු 4.00ත් අතර පමණි.

9. මාළුන් හා ඉස්සන් ඇල්ලීම සඳහා එළන දැල් භාවිතා කළ හැකි වනුයේ දවසේ පස්වරු 5.00 ත් පෙරවරු 8.00 ත් අතර පමණි.

10. ඉස්සන් ඇල්ලීම සඳහා එළන දැල් භාවිතා කළ හැකි වන්නේ වසරේ දෙසැම්බර් මස ආරම්භයේ සිට පසු වර්ෂයේ අප්‍රේල් මාසය අවසන් වනතෙක් පමණි.

11. මාළුන් සඳහා භාවිතා කළ හැකි එළන දැලෙහි ඇස් ප්‍රමාණය අවම අඟල් 5/8 විය යුතුය.

12. හැඬැල්ලා මත්ස්‍යයින් සඳහා භාවිතා කළ හැකි එළන දැලෙහි ඇස් ප්‍රමාණය අවම අඟල් 2 ½ ත් අඟල් 3ත් අතර විය යුතුයි.

13. ලියාපදිංචි ධීවරයින් සඳහා වර්ෂය පුරා කලපුව තුළ විසිදැල් භාවිතා කිරීමට හැකි වන්නේය.

*07.02 කලපුව තුළ ධාවනය කරන යාන්ත්‍රික බෝට්ටුවල පැණවෙන සීමාවන්,*

1. කලපුව තුළ ධාවනය කරන යාන්ත්‍රික (එන්ජින්) බෝට්ටු හබරාදූව ප්‍රාදේශීය සභාව තුළ ලියාපදිංචි කළ යුතුය. එම ලියාපදිංචිය ප්‍රාදේශීය සභාව විසින් බෝට්ටු හිමියන්ට නිකුත් කිරීමට ප්‍රථම, සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් අදාළ ප්‍රාදේශීය සභාවට කලපු ජල තලයේ බෝට්ටුව ධාවනය සම්බන්ධව ලබාදී ඇති කොන්දේසි හා නිර්ණායකයන් අදාළ බෝට්ටුහිමියා සපුරා ඇත්දැයි සලකා බැලිය යුතුය. එම කොන්දේසි සපුරා නොමැති යාන්ත්‍රික බෝට්ටු කලපුව තුළ ධාවනයට අවසර නොදිය යුතුය.

2. සංචාරකයින් රැගෙන යන යාන්ත්‍රික බෝට්ටු ගණන 30 කට සීමා කළ යුතුය. ඒ සඳහා එම බෝට්ටු හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් ලියාපදිංචි කර තිබිය යුතුය. එම ලියාපදිංචි අංකය පැහැදිලිව පෙනෙන සේ බෝට්ටුවේ බඳෙහි පින්තාරු කොට ප්‍රදර්ශනය කළ යුතුය. මේ සම්බන්ධව අවශ්‍යය ක්‍රමවේදයන් හා නියමයන් ප්‍රදේශීය සභාව විසින් සකසා ගත යුතු ය.

3. කලපුව තුළ යාත්‍රාකරන යාන්ත්‍රික බෝට්ටුවල එන්ජින් ධාරිතාවය අශ්වබල 15ක උපරිමයකට යටත්ව තිබිය යුතු ය.

4. යාන්ත්‍රික බෝට්ටු කලපුව තුළ ධාවනය කළ හැකි කාලය වනුයේ පෙරවරු 8.00 සිට පස්වරු 4.00 දක්වා පමණි.

5. ආපදා අවස්ථාවක දී, ආපදා කළමනාකරණ කටයුතු සඳහා කලපුව තුළ බෝට්ටු ධාවනයට අවශ්‍යය වුවහොත් ඉහත සඳහන් වේලාවන් ආපදා කළමනාකරණ කටයුතු සිදුකරන පාර්ශව සඳහා අදාළ නොවන්නේ ය.

6. කලපුව තුළ ඉහත සඳහන් කාලයෙන් පරිබාහිරව ධාවනය කරන යාන්ත්‍රික බෝට්ටු මඟින් ලියාපදිංචි කලපු ධීවරයින්ගේ දැල්වලට වන හානිය සඳහා අදාළ දැල් හිමියාට දැලෙහි හානි වූ වටිනාකම ගෙවිය යුතු ය.

*07.03 ජලය මත ගොඩ බැස්සවිය හැකි ගුවන් යානා සම්බන්ධයෙන් සීමාවන්*

1. ජලය මත ගොඩ බැස්සවිය හැකි ගුවන්යානා එකක් සඳහා දැනට කොග්ගල කලපු ජල තලය මතට ගොඩබෑම සඳහා අවශ්‍යය අවසරයන් රාජ්‍යය ආරක්ෂක අමාත්‍යාංශය විසින් ලබා දී ඇති අතර එම යානාවට හැර ඉදිරියේ දී වෙනත් කිසිඳු යානාවක් කොග්ගල කලපු ජල තලය මතට ගොඩ බැස්ස වීමට අවශ්‍යය අවසරයන් මෙම සැලැස්මේ පෙන්වා දී සහ-සහභාගීත්ව කමිටුව ලබාදිය හැකි අතර එම ක්‍රමවේදයන්ගෙන් තොරව අවසරයන් ලබා නොදිය යුතු ය.

*07.04 කොග්ගල කලපුව තුළ තහනම් ක්‍රියාකාරකම්*

1. කොග්ගල කලපු මෝය අසල සිට ගාල්ල - මාතර මාර්ගයේ කොග්ගල පාලම දක්වා ප්‍රදේශය තුළ කිසිඳු ධීවර පන්න ක්‍රමයක් භාවිත කිරීම සපුරා තහනම් වේ.

2. කලපුව තුළ ඉස්සන් ඇල්ලීම වෙනුවෙන් සිටුවන ආධාරක ස්ථිරව සවි නොකළ යුතුය.

3. කලපුව තුළ පන්න කිරීමට කලපු කළමනාකරණ කමිටු තුළ සාමාජික නොවූ හා ඒ සඳහා මෙහෙයුම් බලපත්‍ර නොමැති කිසිවෙකුට අවසරය නොමැත.

4. ධීවර පන්න ක්‍රම සඳහා තංගුස් දැල් භාවිත කිරීම සපුරා තහනම් වන්නේය.

5. කලපුව තුළ පහත ක්‍රියාකාරකම් තුළින් හා කලපු ධීවර කළමනාකරණ කමිටු විසින් තීරණය කරන යම් නුසුදුසු පන්න ක්‍රමයක් ඇතොත් ඒවා ද මසුන් ඇල්ලීම සඳහා භාවිතා කිරීම තහනම් වේ.

- දැල් එළා වතුරට තැලීම සහ මාළුන් බිය වැද්දීම
- අතන් ගැම
- මඩ මීරිකා ඉස්සන් ඇල්ලීම
- මාළුන්ට ඇනීම (කම්බි කූරුවලින් සහ උල් ආයුධ වලින්)
- දැල් කූඩු යොදා මසුන් ඇල්ලීම සහ ධීවර පනත තුළින් හඳුනාගෙන ඇති තහනම් පන්න ක්‍රම ද ඇතුළත් වේ.

6. කලපුවේ ජලය මතුපිට හා ගොඩබිම රක්ෂිතය තුළ කිසිඳු තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක්/ කලපුවට අපද්‍රව්‍ය බැහැර කිරීමක් සිදු නොකළ යුතු ය.

7. කලපු මත්ස්‍ය සම්පත ලියාපදිංචි සියළුම ධීවරයින්ගේ පොදු සම්පතක් සේ සලකා කලපුව කොටස්කර භාවිතයට ගැනීමට කිසිදු අයිතියක් නැත්තේ ය.

8 කලපුව තුළ මත්ස්‍ය කොටු/ ඉස්සන් කොටු ඇති කිරීම සපුරා තහනම් වන්නේ ය.

9. කොග්ගල කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම.

10. කොග්ගල කලපු ධීවර සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව විසින් මෙම ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම වාර්ෂිකව පසුවිපරම් කර, සංශෝධන හා වාර්ෂික ක්‍රියාකාරකම් සැළැස්මට ඇතුළත් කළ යුතු ය.

11. කොග්ගල කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්මේ හඳුන්වා දෙන කාරණා උල්ලංඝනය කළ විට,

- කලපුවේ ධීවර කටයුතුවලට අදාළව මෙම සැලැස්ම තුළ ඇති කාරණා උල්ලංඝනය කළවිට, කොග්ගල ධීවර සහ-සහභාගීත්ව කළමණාකරන කමිටුවේ සෑම පාර්ශවකරුවෙකුටම එසේ නීති හා එකඟතාවයන් කඩකරන පුද්ගලයින් හඳුනාගෙන මෙම සැලැස්ම අනුව නිකුත් කරන ධීවර දෙපාර්තමේන්තු නියෝග මාලාව අනුව හා අදාළ පාර්ශව ආයතනයන්ට ලැබී ඇති අණ පනත් අනුව කටයුතු කළ හැකි වන්නේය.

- කලපුව තුළ ධාවනය වන යාන්ත්‍රික බෝට්ටු, කඩොලාන කැපීම, කලපුව ගොඩකිරීම, කලපුව තුළ සිදුකරන ඉදිකිරීම් සම්බන්ධව හා කොන්දේසි කඩකරන පුද්ගලයින්ට හා ආයතනයන්ට එරෙහිව ඕනෑම පුද්ගලයෙකුට හා ආයතනයක් විසින් හබරාදූව පොලිසිය වෙත හා හබරාදූව/ ඉමදූව ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැමිණිලි කළ හැකි වන්නේය. ඒ සමගම එවන් පැමිණිලි ලිඛිතව කොග්ගල සහ-සහභාගිත්ව කමිටුවේ ලේකම් හා සභාපති වෙත යොමු කළ යුතු වන්නේ ය.

12. කොග්ගල කලපු සහ-සහභාගීත්ව කමිටුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් සාමාජික ආයතන විසින් හඳුනාගත යුතුය.

ඇමුණුම - 01

2013 අංක 35 දරන ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත අනුව කොග්ගල කලපු ධීවර කළමනාකරණ ප්‍රදේශය සඳහා පිහිට වූ කොග්ගල කලපු ධීවර සහ-සහභාගීත්ව කළමණාකරන කමිටුවේ නම් කිරීම මත එම කමිටුවට ඇතුළත් විය යුතු නිලධාරීන් හා ආයතන, ප්‍රජා සංවිධාන ලැයිස්තුව පහත පරිදි වේ:

1. දිස්ත්‍රික් ලේකම් - ගාල්ල

2. දිස්ත්‍රික් සැලසුම් හා ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ

3. දිස්ත්‍රික් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු සහකාර අධ්‍යක්ෂ

4 ප්‍රාදේශීය ලේකම් - හබරාදූව

5. ප්‍රාදේශීය ලේකම් - ඉමදූව

6. සභාපති - ප්‍රාදේශීය සභාව - හබරාදූව

7. සභාපති - ප්‍රාදේශීය සභාව - ඉමදූව

8. දිස්ත්‍රික් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු නිලධාරීන් දෙදෙනෙකු (2)

9. නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියෙකු

10. පළාත් ධීවර අධ්‍යක්ෂවරයා

11. වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තු නිලධාරියෙකු

12. නාරා ආයතන නිලධාරියෙකු

13. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නිලධාරියෙකු

14. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරියෙකු

15. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරියෙකු

16. වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරියෙකු

17. සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරියෙකු

18. ඉඩම් අමාත්‍යාංශ නිලධාරියෙකු

19. පොලිස් දෙපාර්තමේන්තු නිලධාරියෙකු - හබරාදූව

20. වෙරළ ආරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරියෙකු

21. ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරියෙකු

22. ශ්‍රී ලංකා ගුවන් හමුදා අණදෙන නිලධාරි - කොග්ගල

23. ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තු නිලධාරියෙකු

24. දිස්ත්‍රික් ගොවිජන සේවා සහකාර කොමසාරිස්

25. කොග්ගල කලපු ධීවර කළමනාකරණ කමිටු 04 වෙනුවෙන් එක් කමිටුවකින් 03ක් බැගින් සාමාජිකයින් 12 දෙනෙකු

26. වාරිමාර්ග දෙපාර්තමේන්තු නිලධාරියෙකු

27. මිනින්දෝරු දෙපාර්තමේන්තු නිලධාරියෙකු

28. දිස්ත්‍රික් කෘෂිකර්ම නිලධාරියෙකු

29. කොග්ගල ආයෝජන මණ්ඩල නිලධාරියෙකු


30. සංචාරක මණ්ඩල නිලධාරියෙකු

31. ගොවිජන සේවා දෙපාර්තමේන්තු - ප්‍රාදේශීය නිලධාරීන් තිදෙනා - කොග්ගල/ පංචාලිය / පරගොඩ

32. ගොවි සංවිධාන නියෝජිතයින් දෙදෙනා බැගින් - තිත්තගල්ල නැගෙනහිර/ තිත්තගල්ල බටහිර/ පැලැස්ස/ හරුමල්ගොඩ/ දොරපේ අම්පාවිල/ වැලිකොන්ද/ කහඳ/ පැලවත්ත/ ඇලපහල

33. රිටිපන්න ධීවර කමිටුව වෙනුවෙන් සාමාජිකයින් දෙදෙනෙකු (2).

ඇමුණුම - 02 :


KOGGALA LAGOON
Scale 1:25,000
N
S
W
E
Koggala Lagoon
SEA
A2
Legend
Important Place
Railway
Main Road
Secondary Road
Track
Foot Path
Bund / Dam
Channel
River / Stream / Canal
Tank
SOUTHERN PROVINCE
Compiled Using 10,000 Database.
Prepared by Survey Department of Sri Lanka , SpecialMapping Unit - 2015 .

ඇමුණුම - 03 :

## 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 32 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරනු ලබන නිවේදනය.

### නිවේදනයයි

අංක 1997/18 සහ 2016.12.15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කොග්ගල කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයේ පහත සඳහන් ධීවර කළමනාකරණ කමිටු පිහිටුවා ලියාපදිංචි කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| ධීවර කළමනාකරණ කමිටුවේ නම | ලියාපදිංචි අංකය |
|---|---|
| 1. කොග්ගල - ගුරුකන්ද කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/කො.ක./01 |
| 2. කොග්ගල - දූව මලලගම කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/කො.ක./02 |
| 3. කොග්ගල - 144ඒ මොදරබොඩ (සිංහධීවරගම) කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/කො.ක./03 |
| 4. කොග්ගල - පැලැස්ස කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/කො.ක./04 |

එම්. සී. එල්. ප්‍රනාන්දු,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2017 ජූලි මස10 වැනි දින.
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත,
කොළඹ 10.

EOG 04 - 0050

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.